www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාක සැලසුම සමග, ඔබාමා එක්සත් ජනපද මිලිටරිවාදය වැළඳගනී

## With Iraq plan, Obama embraces US militarism

**2009 මාර්තු 2**

ඉරාකයේ පූර්න පරිමාන එක්සත් ජනපද මිලිටරි වාඩිලෑමක් තවත් මාස 18කට දීර්ඝ කිරීම ද 2011 අග වන විට දල වසයෙන් හමුදා ඉවත් කරගැනීමක් සඳහා බුෂ් පාලනාධිකාරය විසින් ඒ වන විටත් පිලිගෙන තිබූ කාල සටහනට එකගවීම ද මගින් ජනාධිපති බරක් ඔබාමා සිදු කර ඇත්තේ, 2008 දී ඔහුගේ ජනාධිපති අපේක්ෂකත්වයට සහයෝගය දුන් දශ ලක්ෂ සංඛ්‍යාත යුද විරෝධී ඡන්දදායකයන්ගේ බලාපොරොත්තු පාවාදීමට වැඩි දෙයකි.

“මහා ජනනාශක අවි” සහ ඉරාකය හා 9/11 ත්‍රස්ත ප්‍රහාර අතර සම්බන්ධය පිලිබඳ සිය ආරම්භක කියාපෑම් පච බවට ඔප්පු වීමට පසුව බුෂ් ධවල මන්දිරය ඉරාකයේ වැඩෙන යුද්ධය යුක්තියුක්ත කරනු වස් යොදාගත් ව්‍යාජ තර්ක සමග, එලඹෙන ඩිමොක්‍රැටික් පක්ෂ පාලනාධිකාරය, ඔබාමා විසින්, මුලුමනින්ම අනන්‍ය කරනු ලැබ තිබේ.

ලෙජියුන් කඳවුරේ දී මෙරයින් භටයන් දහස් ගනනක් අමතා ඔබාමා පැවැත්වූ කතාව වනාහි, එක්සත් ජනපදය ඉරාකය අල්ලා ගැනීම හා වාඩිලෑම යුක්තියුක්ත කිරීමේ ද අධිරාජ්‍යවාදී යුද්ධයේ හා පරිපීඩනයේ උපකරනයක් නොව ඒ වෙනුවට විමුක්තියේ උපකරනයක් ලෙස ඇමරිකානු මිලිටරිය ඉදිරිපත් කිරීමේ ද ප්‍රයත්නයක් විය.

ජනාධිපති අපේක්ෂක ඔබාමා “කොහෙත්ම අනුමැතිය නොදිය යුතුව තිබූ හා කොහෙත්ම සිදු නොකල යුතුව තිබූ” දෙයක් ලෙස ඉරාක යුද්ධය විස්තර කලත්, ජනාධිපති ඔබාමා එයට දුන්නේ ඊට බෙහෙවින් වෙනස් කියවීමකි. “ඔබ අත්තනෝමතික භාවයට හා අරාජකත්වයට එරෙහිව සටන් වැද තිබේ” යයි ඔහු එක්රැස් වූ භටයන්ට පැවසීය. “ඔබ ඔබගේ හොඳම මිතුරන් හා නොදන්නා ඉරාක වැසියන් වෙනුවෙන් ලේ හලා තිබේ. ඉරාකයේ ජනතාවට අගනා අවස්ථාවක් ලබා දෙන ගමන් ඔබ ඔබගේ සහෝදර පුරවැසියන් වෙනුවෙන් අතිමහත් බරක් දරා තිබේ.”

“නොදන්නා ඉරාක වැසියන්” මත එක්සත් ජනපද මැදිහත්වීම ඇති කල ප්‍රධාන බලපෑම ඔවුන් ඝාතනය, අංගවිකල හා අවතැන් කිරීම බව, ඉහත හැඟීමබර විස්තරය මගින් දැනගත නොහැකි වනු ඇත. 2003 මාර්තු එක්සත් ජනපද ආක්‍රමනයේ පටන් මේ දක්වා, සිවිල් වැසියන්ගේ නිවහන් ප්‍රදේශවලට එල්ල කෙරුනු එක්සත් ජනපද බෝම්බ, මිසයිල හා ෂෙල් ප්‍රහාරවලින් ඝාතනය වූ ලක්ෂ ගනන් ඇතුලු, දශ ලක්ෂයක් මිය ගොස් ඇත. ප්‍රමානවත් තරම් ඉක්මනින් සිය වාහනවල වේගය අඩු නොකිරීමේ අපරාධය හේතුකොටගෙන එක්සත් ජනපද මුර කපොලුවල දී ඉරාක සිවිල් වැසියන් අනේක සංඛ්‍යාවක් ඝාතනය කෙරී තිබේ.

ඉරාකයේ ජනතාවට දී ඇතැයි කියනු ලබන “අගනා අවස්ථාව” සම්බන්ධයෙන් ගත හොත්, එය වනාහි මුලුමනින්ම පාහේ විනාශ කරනු ලැබ ඇති සමාජයක් පාලනය කරනු වස් එක්සත් ජනපද වාඩිලෑමේ තන්ත්‍රයේ අනුග්‍රහය ලබන පක්ෂවලට හා දේශපාලනඥයන්ට ඡන්දය දීමේ අයිතියයි.

එක්සත් ජනපදය විසින් අල්ලාගනු ලැබීමෙන් වසර හයකට ආසන්න කලකට පසුව, ඉරාකයට තවමත් නල ජලය, විදුලි බලය, ප්‍රමානවත් මලාපවහන පද්ධතියක් හා නවීන ජීවිතයක් සඳහා අවශ්‍ය සෙසු පහසුකම් නොමැත. වැඩිහිටි ජනගහනය අතර විරැකියාව සියයට 50ක් ලෙස තක්සේරු කෙරෙයි. අභ්‍යන්තර හෝ බාහිර පිටුවාහලේ සිටින සරනගතයන් ප්‍රමානය මිලියන 4කි. බොහෝ ඉරාක නගර පිපුරුම්-ආරක්ෂක තාප්ප හා සෝදිසි කපොලු මගින් වෙන්කෙරුනු ජනවාර්ගික හා ආගමික පදනමකින් යුක්ත නිවහන් ප්‍රදේශ බවට බෙදා වෙන් කර තිබේ.

ඔබාමා, එක්සත් ජනපද මිලිටරි ප්‍රහාරය සඳහා පැවති සැබෑ ගාමකයට -- ඉරාකයේ දැවැන්ත තෙල් සම්පත් සහ මැද පෙරදිග මධ්‍යයේ එහි මූලෝපායික පිහිටීමට -- තමන්ගේ සම්බන්ධය ප්‍රතික්ෂේප කිරීම කෙසේ වෙතත් එවැන්නක් පැවතීම පිලිගත්තේ නැත. එම නිශ්ශබ්දතාව මගින් පෙන්නුම් කෙරුනේ නව ජනාධිපති ඔහුගේ පූර්වප්‍රාප්තිකයාගේ අතිමූලික එල්ලයන්, එනම් ලෝකයේ තෙල් හා ගෑස් සැපයුම්වල දැවැන්ත තොගයක මූලාශ්‍රය වන මැද පෙරදිග හා මධ්‍යම ආසියාව මත්තෙහි ඇමරිකානු අධිරාජ්‍යයේ ග්‍රහනය ශක්තිමත් කිරීම, බෙදාහදා ගන්නා බව පමනි.

මෙම කාරනාව, ජනාධිපතිවරනයේ දී ඔබාමාගේ රිපබ්ලිකන් විරුද්ධවාදියා වූ සෙනෙට් සභික ජෝන් මැකෙන්, සෙසු රිපබ්ලිකන් කොංග්‍රස් සභිකයන් හා දක්ෂිනාංශික පුවත්පත් ඇතුලු, බුෂ් පාලනාධිකාරයේ ආක්‍රමන පිලිවෙතෙහි වඩාත්ම උද්යෝගිමත් ආරක්ෂකයන් විසින්, වහාම හඳුනාගන්නා ලදි. නිදසුනක් ලෙස, *වෝල් ස්ට්‍රීට් ජර්නල්*, ඔබාමාගේ ලෙජියුන් කඳවුරේ කතාව, "ඔබාමාගේ බුෂ් සනාථනය" ලෙස හඳුන්වමින්, එයට ප්‍රශංසා කරන කතුවැකියක් පල කලේය.

*ජර්නලය* උද්යෝගිමත්ව මෙසේ සඳහන් කලේය: "ඔබාමා මහතා, දැන් ඔහු දරන ප්‍රධාන අන දෙන නිලධාරි තනතුරට ගැලපෙන පිලිවෙතක් ඉදිරිපත් කරමින්, කල්පනාකාරී කතාවක් පැවැත්වීය." හමුදා නාමිකව ඉවත් කරගන්නා දිනය වන 2010 අගෝස්තු මාසයෙන් පසුව, ඉරාකය තුල විශාල එක්සත් ජනපද මිලිටරි බලකායක්, 50,000ක් තරම් විශාල භට පිරිසක්, තබාගැනීමට, එනම්, පර්සියන් බොක්ක තුල එක්සත් ජනපද රැකඩ තන්ත්‍රයක "මූලෝපායික වාසිය" පවත්වාගෙන යාමට උත්සාහ කරන ක්‍රියාමාර්ගයකට, එකගවීම මගින්, "ඔබාමා මහතා අපේක්ෂකයකු ලෙස ගත් ස්වකීය ආස්ථානයන් පරම ලෙස ම ප්‍රතික්ෂේප කිරීම" එය අවධාරනය කලේය.

ඔබාමා සිය කතාවේ දී පැහැදිලි කල පරිදි, එක්සත් ජනපද හමුදාවලින් කොටසක් ඉරාකයෙන් පිටත යලි ස්ථානගත කිරීම සඳහා වන ප්‍රධාන හේතුවක් වන්නේ, "ඇෆ්ඝනිස්ථානය හා පකිස්ථානය මත යලි අවධානය යොමු කිරීමේ අභියෝගය" සහ "කලාපය පුරා ව්‍යාප්ත ඇමරිකානු මැදිහත්වීමක්" යන කාරනා දෙකට ම මුහුන දීම පිනිස ප්‍රමානවත් මිලිටරි බලයක් ලබාගැනීමයි.

මිලියන සංඛ්‍යාත ඇමරිකානුවන් ඔබාමාට ඡන්දය දුන්නේ, ඉරාකයේ යුද්ධය වඩා පුලුල් අධිරාජ්‍යවාදී එල්ලයන් හඹා යාමෙන් අපසරනය වීමක් ලෙස ඔවුන් විශ්වාස කල නිසා නොව, ප්‍රකුපිත නොකෙරුනු ආක්‍රමනයක් හා ස්වෛරී රටක් යටත් කර ගැනීම අපරාධයක් ලෙස ඔවුන් සැලකූ නිසා සහ සමස්තයක් ලෙස ඇමරිකානු විදේශ පිලිවෙතෙහි කොල්ලකාරී ස්වභාවයට විරුද්ධ වූ නිසාය.

ඔවුන්ගේ හඬ ඔබාමාගේ ධවල මන්දිරයේ පිලිවෙත සූත්‍රගත කිරීමෙහිලා අංශු මාත්‍රයක හෝ බලපෑමක් ඇති කර නැත. පසුගිය සතියේ සිද්ධීන් පෙන්නුම් කරන පරිදි, එහි දේවල් තීන්දු කරන්නේ මිලිටරි-බුද්ධි යාන්ත්‍රනයයි. ඔබාමා ප්‍රධාන අන දෙන නිලධාරියා ලෙස ස්වාධීන තීන්දුවක් ගෙන නැත. ඔහු කර ඇත්තේ, මිලිටරි සංස්ථාපිතයේ එක කන්ඩායමක ක්‍රියාපිලිවෙතට එරෙහිව එහි ම තවත් කන්ඩායමක පිටුබලය ලැබෙන ක්‍රියාපිලිවෙත මත රබර් මුද්‍රාව තැබීමයි.

ලෙජියුන් කඳවුරේ දී ඔබාමා කල කතාවට පසුව පල වූ ප්‍රවෘත්ති වාර්තාවන්ට අනුව, ඔබාමා තෝරාගත්, මාස 19කින් හමුදා "ඉවත්කරගැනීමේ" සැලසුම, ආරක්ෂක ලේකම් රොබර්ට් ගේට්ස් සහ මිලිටරි කාර්ය මාන්ඩලික ප්‍රධානීන්ගේ ඒකාබද්ධ මන්ඩලය විසින් තෝරාගන්නා ලද විකල්පයයි. එන්බීසී ප්‍රවෘත්ති සේවයේ "මාධ්‍ය හමුවෙමු" වැඩසටහනට ඉරිදා දුන් සම්මුඛ සාකච්ඡාවක දී ගේට්ස් තහවුරු කලේ, පෙන්ටගන් නිලධරය, ඇෆ්ඝනිස්ථානය තුල හමුදා යෙදවීමේ අවශ්‍යතාව ද ගැටුම් හටගැනීමේ විභවයකින් යුක්ත සෙසු ස්ථානවල යෙදවීමට ප්‍රමානවත් නොවන පරිදි එය උවමනාවට වඩා ඇදීම ද සම්බන්ධයෙන් උත්සුකව, වඩා කෙටි කාල සටහනකට කැමැති වූ අතර, ජෙනරාල් රේමන්ඩ් ඔඩීර්නෝගේ නායකත්වයෙන් යුක්ත ඉරාකයේ ක්ෂේත්‍ර අන දෙන නිලධාරින් හමුදා ඉවත් කරගැනීමේ මාස 23ක කාල සටහනකට කැමති වූ බවයි.

තමන් බලයට පත් වූ විට, ඔබාමා, බුෂ් පාලනාධිකාරයේ ප්‍රධාන මිලිටරි තීන්දු ගන්නන්ගෙන් කිසිවෙකුත් ඉවත් කලේ නැත. ඒ වෙනුවට, ඔහු ගේට්ස්, මිලිටරි කාර්ය මාන්ඩලික ප්‍රධානීන්ගේ ඒකාබද්ධ මන්ඩලයේ සභාපති අද්මිරාල් මයිකල් මුලන්, ඔඩීර්නෝ සහ ඉරාකයේ හමුදා බලය" හදිසියේ ඉහල නැංවීමේ" පිලිවෙතෙහි නිර්මාතෘ, එක්සත් ජනපද මධ්‍යම අන දෙන මන්ඩලයේ ප්‍රධානි ජෙනරාල් ඩේවිඩ් පෙට්‍රියුස් යන අය එම තනතුරුවල තබා ගත්තේය.

ඔබාමා සිය කතාව සඳහා තෝරාගත්තේ, සිවිල් ශ්‍රාවකත්වයක් හෝ ධවල මන්දිරයේ සිට කෙරෙන රූපවාහිනී විකාශනයක් නොව, මෙරයින් කඳවුරක නිල ඇඳුම් ලාගත් භටයන්ගෙන් සමන්විත ශ්‍රාවකත්වයක් ය යන කරුන තුලම ඔහු මිලිටරිවාදය වැලඳගැනීම පෙන්නුම් කෙරුනි. එහි බලපෑම වූයේ 2009 වසරේ ඇමරිකාව තුල යුද්ධය හා සාමය පිලිබඳ තීන්දු ගන්නේ මූලිකවම මිලිටරියේ උත්සුකතාව අනුව වන බවත් ඇමරිකානු ජනතාව පසෙකට වී බලා සිටින්නන්ගේ තත්වයට ලඝු කෙරෙන බවත් යෝජනා කිරීමයි.

සමස්ත ක්‍රියාදාමයම ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ බාදනය පෙන්නුම් කරයි. ඇමරිකානු ජනතාවට, එකකට පසුව එකක් එන මැතිවරනවල දී සිය ඡන්දය පාවිච්චි කිරීම මගින්, ආන්ඩුවේ විදේශ හා මිලිටරි පිලිවෙත්වල කිසිදු වෙනසක් සිදු කල නොහැකිය. මහජන මනෝගතිය නොතකා, ඉරාකයේ යුද්ධය ඉදිරියට යන අතර, ඇෆ්ඝනිස්ථානයේ යුද්ධය උත්සන්න කෙරෙයි.

**පැට්‍රික් මාටින්**

© www.wsws.org